# ශ්‍රී ලංකාවේ දේවස්ථානවල රඤ්ජිත වීදුරු සිතුවම්වලින් නිරූපණය වන තේමා

එස්. ඒ. ඒ. එස්. විමලරත්න[1]

ශ්‍රී ලංකාවේ දේවස්ථාන ආශ්‍රිත ව බිහි වූ කලා නිර්මාණාංග අතරින් රඤ්ජිත වීදුරු සිතුවම් සඳහා හිමි වන්නේ සුවිශේෂත්වයකි. බොරැල්ලේ සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානය, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දෙව් මැදුර හා ගාල්ලේ ශ්‍රී හෘදය කන්‍යාරාම දේවස්ථානය යන දේවස්ථාන ත්‍රිත්වයෙහි රඤ්ජිත වීදුරු සිතුවම් දැකගත හැකි වේ. දේවස්ථාන ආශ්‍රිත ව වර්ධනය වූ රඤ්ජිත වීදුරු කලාව ධර්ම උපදේශන මාධ්‍යයක් සහ අලංකරණ අංගයක් වශයෙන් භාවිත විය. එහෙත් මෙහි වාස්තු විද්‍යාත්මක පදනමක් ද වේ. ගොතික දේවස්ථානවල වහලයේ බර දරනු ලැබුවේ කුලුනුවලින් හා ආරුක්කුවලිනි. ඒ නිසා බිත්තිවල විශාල හිස් අවකාශයක් ඉතිරි වේ. ඒ හිස් අවකාශය අවම කිරීම සඳහා දේවස්ථාන බිත්තිවල වූ කවුළු මත රංජිත වීදුරු සිතුවම් නිර්මාණය කර ඇත. පිටත ආලෝකය පාලනයක් සහිත ව ගෘහ අභ්‍යන්තරයට ගැනීමට ද මෙමගින් ඔවුන් අපේක්ෂා කරන්නට ඇත. ලංකාවේ දේවස්ථානවල දක්නට ලැබෙන සිතුවම් විදේශවල නිර්මාණය කර මෙරටට ආනයනය කරන ලද ඒවා ය. මේ සිතුවම් ප්‍රධාන වශයෙන් දැකිය හැකි වන්නේ දේවස්ථානයේ අල්තාරය පිටුපස ජනෙල් කවුළුවල හා ප්‍රධාන ශාලාව දෙපස වූ ජනෙල් කවුළු මත ය. මීට අමතර ව දේවස්ථානයට පිවිසෙන දොරටුවලට ඉහළින් ද මේවා දැකගත හැකි වේ. මේ සිතුවම්වලින් යම් යම් තේමා, සිද්ධි හෝ පුද්ගල චරිත නිරූපණය කිරීමට ශිල්පියා සමත් විය. ඒවායින් නිරූපණය වන වස්තු විෂය ලෙස බයිබලීය උපමා කතා, දේශන හා දේව වචනය වැනි සංකල්ප සහිත රඤ්ජිත වීදුරු, ක්‍රිස්තුස් වහන්සේගේ, දේව මාතාවන්ගේ හා අනෙකුත් බයිබලීය චරිතවල ජීවිත තේමා හා ඔවුන්ගේ ජීවිතයේ විශේෂ අවස්ථා නිරූපණ සහිත රඤ්ජිත වීදුරු, අපෝස්තුලුවරුන්, සාන්තුවරුන්, අනාගත ශාස්ත්‍රවරුන් හා ඔවුන්ගේ ජීවිත තේමා සංකේත නිරූපණ සහිත රඤ්ජිත වීදුරු ආදිය දැක්වීමට පිළිවන. රංජිත වීදුරු සිතුවම්වල සුවිශේෂතා කිහිපයක් ද හඳුනාගැනීමට හැකි විය. මේ සිතුවම් නිර්මාණය කිරීම සඳහා වර්ණ රැසක් භාවිත කර ඇති අතර රතු, කහ, කොළ, දුඹුරු හා නිල් වැනි වර්ණ මින් ප්‍රධාන වේ. මීට අමතර ව විවිධ වර්ණ සහ ඒවායේ වර්ණ ප්‍රභේද භාවිත කිරීම මඟින් සිතුවමට ත්‍රිමාන බවක් එක් කර ඇත. සිද්ධි නිරූපණය කරන සිතුවම්වල පර්යාවලෝකනය හා ගැඹුර නිරූපණය කර ඇති අතර ප්‍රධාන වස්තු විෂය වටා විවිධ වූ හැඩවලින් යුත් මෝස්තරාංග භාවිත කිරීමෙන් අලංකාරවත් බව තව තවත් තීව්‍ර කර ඇත. සමාන ආකෘතියකට අනුව නිම කිරීම සහ සිතුවම්වල වස්තු විෂයයට අදාළ සිද්ධි සවිස්තරාත්මක ව හා තාත්ත්වික ව නිරූපණය කිරීම ද විශේෂත්වයකි.

**ප්‍රමුඛ පදඃ** රංජිත වීදුරු, ගෘහ අලංකරණය, ආලෝක පාලනය, වර්ණ, සංකේත නිරූපණ

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසඟිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය